**තිරප්පනේ ප්‍රාදේශීය සභාව**

**2022.06. 16 වන දින පෙ.ව 10.00ට පැවති මහ සභා රැස්වීම**

***පැමිණ සිටි ගරු මන්ත්‍රීවරුන්:***

1. ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා - ගරු සභාපතිතුමා
2. ඒ. අන්වර් සදාක් මැතිතුමා - ගරු සභික තුමා
3. එස්.තිස්ස විජේසිංහ මැතිතුමා - ගරු සභික තුමා
4. ජී.නිමල් රාජපක්ෂ මැතිතුමා - ගරු සභික තුමා
5. බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා - ගරු සභික තුමා
6. එච්.බී.නලින් හේරත් මැතිතුමා - ගරු සභික තුමා
7. ඒ.ජී.මරියහාමි මැතිනිය -ගරු සභික තුමිය
8. කේ. නදීකා සෙව්වන්දි කරුණාරත්න මැතිනිය - ගරු සභික තුමිය
9. ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා - ගරු සභික තුමා
10. ජේ.රෝහණ විජේතිලක මැතිතුමා - ගරු සභික තුමා
11. ටිකිරි බංඩාර වනසිංහ මැතිතුමා - ගරු සභික තුමා

***නොපැමිණි ගරු මන්ත්‍රීවරුන් :***

1. පී.මධුර කුමාර පියරත්න මැතිතුමා - ගරු සභික තුමා
2. එච්.එම්.නාසිම් මැතිතුමා - ගරු සභික තුමා
3. ආර්.පී.නිසංසලා ලක්මාලි අබේරත්න මැතිනිය - ගරු සභික තුමිය

***නොදන්වා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන් :***

1. ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා - ගරු සභික තුමා
2. එන්.රශ්මි සංකල්පනා මිය - ගරු සභික තුමිය

***සහභාගී වූ නිළධාරීන් ;***

1. ආර්.පී.පී. රේණුකා ලියනගේ මිය - ලේකම්
2. එම්.ආර්.ඩබ්.සී.කේ.රණවීර මිය - විෂය ලිපිකරු

**(අ) පසුගිය රැස්වීම් වාර්තා සම්මත කිරීම.**

**- 2022.05.24 දින පැවති ගරු මහා සභා වාරයේ වාර්තාව සභා සම්මත කිරීම.**

අද දිනට නියමිත ගරු මහා සභාවේ න්‍යාය පත්‍රයේ මුලින්ම තිබෙන්නේ 2022.05.24 දින පැවති ගරු මහ සභා වාර්තාව සභා සම්මත කර ගැනීමයි.ඒ අනුව පසුගිය සභා වාර්තාවට සංශෝධන තිබේනම් ඒවා ඉදිරිපත් කරන ලෙසත්, පසුගිය සභා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් මම ගරු මහ සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි,ගරු මහ සභාවෙන් අවසරයි. 2022.05.24 දින පැවති ගරු මහා සභා වාර්තාවේ සංශෝධනයක් තියෙනවා. පිටු අංක 12 හි යෝජනා අංක 91- 05-2022 හි සඳහන් කර ඇත්තේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත වුනා කියලා. ඒක මාගේ විරෝධතාවයට යටත්ව සභා සම්මත වුනා කියලා සඳහන් කරන්න.

**යෝජනා අංක 103 - 06-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

සියළු දෙනාගෙන්ම අවසරයි.සංශෝධන සහිතව පසුගිය මහ සභා වාර්තාව සත්‍ය හා නිවැරදි බවට මම යෝජනා කරනවා.

**ගරු සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් අදාළ සංශෝධනයන්ට යටත්ව 2022 මැයි මස 24 වන දින පැවති ගරු මහා සභා වාර්තාව පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.*

***<u>2022.05.24 දින මහා සභාවේ සංශෝධනය විය යුතු කොටස.</u>***

- **<u>පිටු අංක 12 හි,</u>**

**<u>ලිපි අංක XIV</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා</u>**

ඉහළ කලංකුට්ටිය , කලංකුට්ටිය ,ගල්නෑව ලිපිනයේ පිහිටි කැනෝලා කන්ස්ට්‍රක්ෂන්ස් ඇන්ඩ් ඉංජිනියර්ස් යන ආයතනය විසින් අංක 547 ඉඳිගහවැව තුලානේ පිහිටි රජයේ ඉඩම් කොටසකින් කළු ගල් කැනීම සඳහා ඉ.කො.78 බලපත්‍රයක් ලබා දීමට අවශ්‍ය නිර්දේශ ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**<u>යෝජනා අංක 91 - 05-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - මධුර කුමාර පියරත්න මැතිතුමා</u>**

මෙය ලබා දීම සුදුසු බව මම යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ. අන්වර් සදාක් මැතිතුමා.</u>**

එම යෝජනාව මම ස්ථිර කරමි.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි,මම මේ ගල් සහ බොරළු වලවල් වලට සම්පූර්ණයෙන්ම විරුද්ධයි.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව ගරු ප්‍රාදේශීය සභා සභික ජේ.රෝහණ විජේතිලක මැතිතුමා මේ සඳහා විරෝධතාවය පළ කල අතර ,පැමිණ සිටි අනෙකුත් සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>(ආ) ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.</u>**

විශේෂ නිවේදන යටතේ මට කියන්න තියෙන්නේ දැනට රටේ පවත්නා ආර්ථික තත්ත්වයත් සමඟ සේවකයන්ගේ පැමිණීම සීමා කරලා සභාව පවත්වාගෙන යාමට සිදුවෙලා තියෙනවා.ඒ වගේම මේ කාලයේදී පොදුවේ සියළු දේශපාලඥයන්ට මහජනතාවගේ විරෝධය එල්ල වෙලා තියෙනවා.ඒ නිසා මම ඔබතුමාලගෙන් ඉල්ලා සිටින්නේ පක්ෂ පාට භේදයකින් තොරව සභාවේ ගෞරවය ආරක්ෂා වෙන විදිහට සහයෝගයෙන් වැඩ කරමු කියලා .

**<u>(ඇ) ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ , පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන මහා සභාවට ඉදිරිපත් කිරීම.</u>**

- ඒ අනුව ආදායම් පරීක්ෂක මහත්මා විසින් 2022 මැයි මස ආදායම් වාර්තාව ඉදිරිපත් කර සිටිනවා.ඒ අනුව මැයි මස ආදායම ලෙස රු.381,941.60 ක මුදලක් ආදායම් පරීක්ෂක මහතා විසින් එකතු කර තිබෙනවා.එයද මම දැන ගැනීම සඳහා ගරු මහ සභාවට ඉදිරිපත් කරනවා.

**<u>(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.</u>**

**<u>ලිපි අංක I.</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

පිළසරු ඒකකයේ මුරකරුවන් නිදහසට කරුණු ඉදිරිපත් කර ඇති ලිපිය ලිපිය ගරු මහ සභාවට සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි .

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.</u>**

සේවකයින් සම්බන්ධයෙන් සෘජුවම සභාපති තුමා සහ ලේකම් තුමිය අදාළ සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස යෝජනා කරමි.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

පිළිසරු ඒකකයේ ස්ථිර මුරකරු එක්කෙනෙක් ඉන්නවා.නිජාබ්දීන් අසනීප තත්ත්වයෙන් ඉන්නවා.සේවකයෝ දෙන්නා අතර කළමණාකරනයක් නොමැති වීම නිසා මෙම ගැටළුව ඇති වුනේ.වෙනත් අදහස් තිබේනම් ඉසිරිපත් කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

පිළිසරු ඒකකයේ මුරකරුවන් දෙදෙනෙක් නොසිටි කාරණය සම්බන්ධයෙන් කාර්යාලයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගන්නේ නෑ.තුන්වෙනි මාසයේ නොපැමිණීම සම්බන්ධයෙන් ලිපියට ජූනි මාසයේ කරුණු ඉදිරිපත් කරනවා.ලියුම ගහපු කෙනා ගණන් ගන්නෙත් නෑ.පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් එනකොට මේ දෙදෙනාම ඉදලා නෑ. සමහර සේවකයෝ අපිත් එක්ක තරහයි.සේවකයෝ කියන දෙයක් අහන්නෙත් නෑ කැමති නම් වැඩට එනවා නැතිනම් නෑ.පාලනය කිරීම සම්බන්ධයෙන් නම් සෑහීමකට පත්වෙන්න බෑ.අසනීප තියෙන සේවකයන්ට යම් යම් සහන දිය යුතු නමුත් ඒ වගේ දුර්වල අය ආයතනයේ සේවයේ යෙදවීම නුසුදුසුයි.ආයතනයේ බඩුභාහිරාදිය නැති වෙන්නත් පුළුවන්.එබැවින් මින් ඉදිරියට මෙවැනි සිදුවීම් සිදු නොවීමට ආයතනයේ පවතින නීති රීති වලට යටත්ව සුදුසු තීරණයක් ගන්නා ලෙස මම ඉල්ලා සිටිනවා.

**<u>ලිපි අංක II.</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

වෙල්ලමුදාව,තිරප්පනේ ලිපිනයේ පදිංචි කේ.සිසිලියා යන අය විසින් අංක 539 වෙල්ලමුදාව තුලානේ පිහිටි රජයේ ඉඩම් කොටසකින් බොරළු කැනීම සඳහා ඉ.කො.78 බලපත්‍රයක් ලබා දීමට අවශ්‍ය නිර්දේශ ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවට සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි .පරිසර කමිටුවෙන් සහ තාක්ෂණික නිළධාරී ගැටළුවක් නෑ කියලා අදාළ නිර්දේශය දීලා තියෙනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.</u>**

බොරළු වලවල් මෙපමණ අපට පාරවල් හදන්න අවශ්‍යද.නැත්නම් බොරළු මොකටද ? ඉඩම් හිමියා නෙමෙයි බොරළු ඉල්ලන්නේ.පයින්ඩිකුලම බොරළු වල ගත්තහම ඒක කපන්නේ එප්පාවල එක්කේනෙක්. සංවර්ධන ව්‍යාපෘති නතර වෙනවා කියලා මේවට අවසරය දුන්නට ආයෙත් ඉල්ලීම් එනවා.අපි ඔක්කොම බොරළු වලවල් සම්බන්ධයෙන් පොදු තීන්දුවක් ගමු.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

සීයට සීයක් බොරළු නොදී ඉන්න බෑ.රටේ තවත් තැන් වල සංවර්ධන කටයුතු සිදුවෙනවා.අපිත් වැලි අවශ්‍ය වුනාම මනම්පිටියෙන් වැලි ගේනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.</u>**

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අපට සම්පූර්ණයෙන් ලිපි ගොනුව එවන්න කියන්න.අපිට අධ්‍යනයක් කරන්න.බොරළු සඳහා ඉල්ලීම් එක දිගට එන එකයි ගැටළුව.තිලිණ මන්ත්‍රීත්මා කියනවා බොරළු වලවල් දෙන එකේ ගැටළුවක් නෑ.ඒත් සුදුසු නෑ කියලා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

රටේ සංවර්ධනය සඳහා අපේ සම්පත් භාවිතා කල යුතුයි.ගියවර මහ සභාව සඳහා බොරළු සම්බන්ධයෙන් ඉල්ලීම් හතක් ඉදිරිපත් කරලා තිබුනා.අපේ බල ප්‍රදේශයේ සම්පත් අපි ආරක්ෂා කල යුතුයි.දැනට තිරප්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බොරළු වලවල් 20 ක් 25 පමණ ක්‍රියාත්මකයි.මේ වන විට සංවර්ධන ව්‍යාපෘති සීයට අනුවක් පමණ නතර වෙලා තියෙන්නේ. පසුගිය

දවස් වල අනුමැතිය ලබා දුන් බොරළු වලවල් එක ආයතනයකින් වත් නිරීක්ෂණය කරලා නෑ.අපි අවුරුද්දකට බොරළු,ගල් සහ වැලි සම්බන්ධයෙන් යම් සීමාවක් සහිතව අනුමැතිය ලබා දීම සඳහා පොදු තීරණයක් ගමු.එතකොට සංවර්ධන ව්‍යාපෘති නතර වෙන්නෙත් නෑ.ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එවන ලිපි වල ඉල්ලුම් කරන බොරළු ප්‍රමාණය පමණක් සඳහන් එවා ඇති නිසා මින් ඉදිරියට අදාල වලංගු කාල සීමාවක් සහිතව එවන ලෙස දන්වා යැවීමට කටයුතු කරන්න.

<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>

බලපත්‍ර නිකුත් කරන්නේ යම් කාල සීමාවකට පමණයි.ඉවර වුනාම ආයේ ආයෙත් දෙන්න වෙනවා.අපි අවුරුද්දකට බලපත්‍ර පහක් විතර දෙමු.

<u>යෝජනා අංක 104 - 06-2022.</u>

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා.</u>

පරිසර කමිටුවේ සභාපති තුමත් මමත් බොරළුවල නිරීක්ෂණය කලා.බැලුවා.මේකේ මහජන විරෝධතාවයක් නෑ.අවට වනාන්තරත් නෑ. අපි අයිතිකරුවෝ එක්කත් කතා කලා.මෙම ඉඩමට මායිම් වන බොරළු වල අමානුෂික ලෙස අත්හැරදාලා තියෙනවා.ඒක මෙයාලා නෙවේ කරලා තියෙන්නේ.එබැවින් මෙම බොරළුවල සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.</u>

මගේ මතය නම් මහජනතාව සහ ඉඩම් හිමියා විරුද්ධ නැත්නම් සභාවෙන් ඇයි විරුද්ධ වෙන්නේ.යම් ගැටළුවක් තියෙනවා නම් අපි විරුද්ධ වෙලා නවත්තමු.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා.</u>

පරිසර කමිටුව විදිහට අපි මේක බලන්න ගියාම ප්‍රදේශයේ මිනිසුන්ගෙන් අපි විමසනවා.විරුද්ධ වීම සාධාරණ නම් අපි විරුද්ධ වෙනවා.

<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

<u>ලිපි අංක III.</u>

<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>

ගල්වඩුවාගම, ගල්කුලම ලිපිනයේ පදිංචි ඒ.ඒ.එස්.වී.අබේසිංහ යන අය විසින් අංක552 ඇතුන්ගම දකුණ තුලානේ පිහිටි රජයේ ඉඩම් කොටසකින් කළු ගල් කැනීම සඳහා ඉ.කො.78 බලපත්‍රයක් ලබා දීමට අවශ්‍ය නිර්දේශය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවට සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි .

තාක්ෂණික නිළධාරී සහ පරිසර කමිටුවෙන් නිර්දේශ කරලා තියෙනවා

<u>යෝජනා අංක 105 - 06-2022.</u>

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.</u>

අපි මේක බැලුවා මහජන විරෝධතාවයක් නෑ.එබැවින් මෙම කළු ගල් කැණීමේ බළපත්‍රය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා.</u>

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක IV.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ඉදිගහවැව, එප්පාවල ලිපිනයේ පදිංචි එම්.රේණුකා දිසානායක යන අය විසින් අංක 554 පයින්ඩිකුලම තුලානේ පිහිටි රජයේ ඉඩම් කොටසකින් කළු ගල් කැනීම සඳහා ඉ.කො.78 බලපත්‍රයක් ලබා දීමට අවශ්‍ය නිර්දේශය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවට සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි .

**යෝජනා අංක 106 - 06-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා.**

මේ සඳහා මහජන විරෝධතාවයන් නොමැති බැවින් අදාළ කළු ගල් කැනීම් බළපත්‍රය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක V.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

2010 වර්ෂයේදි උතුරු මැද පළාත් සභාවෙන් ලද වටිනාකම රු.640,300.00 ක් වූ සහල් සැකසුම් මධ්‍යස්ථාන උපකරණ අයිතම කිසිදු ප්‍රයෝජනයක් නොගෙන ගබඩාව තුළ රඳවා ගෙන තිබෙන බව 2022.04.27 දිනැති සහකාර විගණකාධිපත්ගේ අංක ANP/F/TPPS/21/2022/11/ ( C ) දරණ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ගරු මහ සභාවට සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි .

මෙම ගැටළුව කල් දැමීමට නොහැකි බැවින් මෙම මහ සභාවේදී සුදුසු තීරණයක් ගත යුතුය.

**යෝජනා අංක 107 - 06-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

සහල් පිටි කට්ටලය මෙම ප්‍රාදේශීය සභාවට ලබා දීලා අවුරුදු 12 ක් වෙලා තියෙනවා.කාට හරි දෙන්න සියළු දෙනා උත්සාහ කලා.මම අදාළ උපකරණත් බැලුවා.මේවා ඔක්කොම චීනයේ නිෂ්පාදිත බඩු .මේ දවස් වල තෙල් සහ පිටි ප්‍රශ්ණය තියෙන නිසා තමයි ගැටළුව.එබැවින් සුදුසු වෙන්දේසි ක්‍රියා පටිපාටී වලට යටත්ව වෙන්දේසි කිරීමට සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක VI.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

අනියම් සේවකයින් වැඩට ගෙන්වීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති කාල සටහන ගරු මහ සභාවට සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගියවර සභාවෙන් අනුමතකළ නිසා ආයෙත් ඉදිරිපත් කිරීම අවශ්‍යා වෙනේ නෑ.

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**ලිපි අංක - I .**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ආදායම් පරීක්ෂක එස්.ටී.එස්.සී.තිලකරත්න මහතා විසින් ක්ෂේත්‍ර පරීක්ෂාව සඳහා යාම වෙනුවන් ඉන්ධන ලබා ගැනිම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවට සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කරමි.

**යෝජනා අංක 108 - 06-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - ටිකිරි බංඩාර වනසිංහ මැතිතුමා**

අදායම් පරික්ෂක මහතාට ක්ෂේත්‍ර පරික්ෂාව සඳහා යාම වෙනුවෙන් අදාළ ඉන්ධන සහනය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - II .**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ අබලි වාහන සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවට සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**යෝජනා අංක 109 - 06-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි ගරු මන්ත්‍රීතුමනි, පාවිච්චියට ගත නොහැකි අබලි වාහන රාශියක් තියෙනවා.මේවා සභාවට කිසිදු ප්‍රයෝජනයක් ගත නොහැකි බැවින් නිසි ක්‍රමවේදයන්ට අනුව තක්සේරු කර වෙන්දේසි කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජී.නිමල් රාජපක්ෂ මැතිතුමා.**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - III.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

අංක 16,කරඹෑගම,මරදන්කඩවල ලිපිනයේ පදිංචි කහටගස්තැන්නේ එගොඩ ගෙදර නිශාන්ත සුදර්ශණ කුලතිලක යන අය විසින් අංක 541- මානක්කුලම තුලානේ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.5332 ක් පමණ වන රජයේ ඉඩම් කොටසක තාවකාලික පදනමින් ගල් ඇඹරුම් මධ්‍යස්ථානයක් ආරම්භ කිරිම සඳහා ඉ.කො.75 බලපත්‍ර ලබා දෙන ලෙස ඉල්ලා ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

මෙම ඉඩම අසල නිවසක් තියෙන නිසා කාර්මික නිලධාරී අනුමැතිය ලබා දීම නුසුදුසු බවට සටහන් කරලා තියෙනවා.

**යෝජනා අංක 110 - 06-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

නිවයේ දුර ප්‍රමාණය සලකා බැලීමේදී ගල් අඹරුම් මධ්‍යස්ථානය ආරම්භ කිරිම සඳහා අනුමැතිය ලබා දීම නුසුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - IV.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

කඳුපාගම,මරදන්කඩවල ලිපිනයේ පදිංචි එස්.පි.සිරිසේන මා විසින් කඳුපාගම තුලානේ හෙක්ටයාර 7.6 ක් පමණ වන රජයේ බිම් කොටස තුළ සත්ත්ව පාලන ගොවිපලක් පවත්වාගෙන යාම සඳහා දිර්ඝ කාලින බදු බලපත්‍ර ලබා දෙන ලෙස ඉල්ලා ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තිරණයක් ගැනිම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

මෙම ඉඩමේ මායිම් පිළිබඳ ගැටළුවක් පවතින බවත්, වම් පැත්තේ කැලයක් තියෙන බව තාක්ෂණ නිළධාරී සටහන් කරලා තියෙනවා.

**යෝජනා අංක 111 - 06-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**

මේක ඉල්ලුම් කරන ඉඩම් ප්‍රමාණය අක්කර 20 ක පමණ විශාල බැවින් එම ප්‍රදේශයේ කිරි ගොවි සමිතියේ අදාළ වගකිවයුතු නිලධරින් අත්සන් කරලා පොදු එකඟතාවයක් ලබා දෙනවා නම් අනුමැතිය ලබා දිම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

මෙම ඉඩම අක්කර 20 ක් පමණ ඉඩමක්. මෙම ගමේ බහුතරයක් කිරි ගව පාලනය කරන අය තමයි ඉන්නේ.එක්කෙනෙක්ට දෙන්න ගියොත් ඉදිරියට ප්‍රශ්න ඇතිවෙයි.හත් අටදෙනෙකුට අක්කර 20 ක් දෙන්න බෑ. රෝහණ මන්ත්‍රීතුමාගේ අදහසත් සමඟ ස්වේච්ඡා සංවිධාන හරහා පරිසර කමිටුවෙන් මේ පිළිබඳව සොයා බලන්න. ඒ අනුව මෙම ලිපිය ඉදිරි මහා සභාවට යොමු කරන ලෙස මම යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා.**

මෙම ඉඩම අක්කර 19 ක ඉඩමක් පරිසර කමිටුව විදියට අපට බලන්න බැරිවුනා.නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව ලබන මහ සභාවට ඉදිරිපත් කිරීමට කල් ලබා දෙන ලෙස පරිසර කමිටුවේ සභාපති තුමා මට දැන්වූවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - V.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

2023 අයවැය ලේඛණය සකස් කිරීම සඳහා වූ කාල සටහන ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**යෝජනා අංක 112 - 06-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.**

සභාගත කරන ලද කාලසටහනට අනුව 2023 වර්ෂයේ අයවැය සකස් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජී.නිමල් රාජපක්ෂ මැතිතුමා.**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක VI.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ඇණවුම් වලට ඉන්ධන නිකුත් කිරීම සම්බන්ධව ගල්කුලම ෆුවල් මාර්ට් ආයතනය එවා ඇති ලිපිය. ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

මෙහිදී ගල්කුලම ෆුවල් මාර්ට් ආයතනයේ ඉන්ධන නිකුත් කිරීම සඳහා රුපියල් ලක්ෂයක ඇප තැම්පත් මුදලක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත.

**යෝජනා අංක 113 - 06-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

රුපියල් ලක්ෂයක ඇප තැම්පත් මුදලක් ලබා දීම සුදුසු බවට සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා.**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක VII</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා</u>**

අඩු ආදායම් ලබන පළාත් පාලන ආයතන වල ආදායම් තතත්වය ඉහල නැංවීම සඳහා යෝජනා කැඳවීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාව සඳහා ඉදිරිපත් කරනවා.

කඩ කාමර වල ඉතිරි වැඩ නිම කිරීම සඳහා සහ වාහන සේවා කරන ස්ථානයක් ස්ථාපිත කිරීම සුදුසු බව මම හිතනවා.

**<u>යෝජනා අංක 114 - 06-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.</u>**

කඩ කාමර බදු දුන්නද බදු මුදුල් ලෙස ලැබෙන මුදල සීමිතයි.ඒක අපට ප්‍රමාණවත් නෑ.පරිපාලනය කවුරු අතට පත් වුනත් තිරප්පනේ බළප්‍රදේශයේ බොරළු අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා බොරළු වලක් සහ වී මෝලක් ස්ථාපිත කිරීම සුදුසු බවට මම යෝජනා කරමි..මේ තියෙන අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න. ඒ තුලින් කළු කඩ ඉවත් කරන්න පුලුවන්.රැකියා අවස්ථා උත්පාදනය වෙනවා.ගොවියාට සධාරණය ඉටු කරන්නත් පුලුවන්.

**<u>යෝජනා අංක 115 - 06-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

අඩු ආදායම් කියන තැනින් අපි මිදෙන්න ඕන.තිරප්පනේ ප්‍රාදේශීය සභාවට වාහන නිළධාරීන් ඇතුළු සම්පත් දීලා තමයි අඩු ආදයම්ලාභී වෙලා තියෙන්නේ.මේකට අපි නිසි ක්‍රමවේදයක් හදන්න ඕන.ඒ අනුව පහත සඳහන් යෝජනා සුදුසු බවට මම යෝජනා කරමි.

- ❖ නාච්චාදුව නිවාස සංකීර්ණයක් ඉදි කිරීම
- ❖ ගම සමඟ පිළිසඳරක් යන ව්‍යාපෘතිය යටතේ සාදා නිම කිරීමට ඉතිරිව ඇති කඩ කාමර සාදා නිම කිරීම
- ❖ වාහන සේවා ස්ථානයක් ස්ථාපිත කිරීම
- ❖ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම

**<u>යෝජනා අංක 116 - 06-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

ආදායම් එන මාර්ග තමයි අපි හොයන්න ඕන. නාච්චාදුව උද්‍යානයේ ඉතිරි දේවල් නිම කරලා බෝට්ටු සවාරි ස්ථානයක් ආරම්භ කරන්න පුලුවුන් එතන කබානා හදන්නත් පුලුවන්.එතෙන ලොකු ගලක් තියෙනවා ඒකට නගින්න ක්‍රම වේදයක් හදන්නත් පුලුවන්. එම යෝජනාත් ඇතුළත් කරලා තිස්ස මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනා මම ස්ථිර කරමි.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනා සභා සම්මත විය.*

**<u>ලිපි අංක VIII.</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

වනජීවී කාර්යාලය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එවා ඇති ලිපිය ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

**<u>යෝජනා අංක 117- 06-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා.</u>**

වන ජීවී කාර්යාලය තුලින් මහජනතාවට සේවා සපයන බැවින් මෙ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - අන්වර් සදාක් මැතිතුමා.</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක IX.</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

දෙමටැගම,නාච්චාදූව,සඳපාගම ගව මස් වෙළඳසැල ජනවාරි සිට මාර්තු මස දක්වා වසා දැමීම නිසා බදු මුදල් නිදහස් කර දෙන ලෙසට

එස්. එම්. ලතීෆ් මහතා විසින් එවා ඇති ලිපිය ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

**<u>යෝජනා අංක 118 - 06-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස් තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන වසා තිබූ කාලයට බදු මුදල් නිදහස් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - අන්වර් සදාක් මැතිතුමා.</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>(ඊ) කාරක සභාවල වාර්තා ඉදිරිපත් කිරිම</u>**.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

කාරක සභා වාර්තා ඉදිරිපත් කිරිම යටතේ පහත සඳහන් කමිටු වාර්තා මහ සභාවේ දැන ගැනිම සඳහා මම ඉදිරිපත් කර සිටිනවා.

I. 2022.05.24 වන දින පැවති ළමා හා කාන්තා කමිටු වාර්තාව.
II. 2022.05.31 වන දින පැවති පරිසර හා පහසුකම් කමිටු වාර්තාව.
III. 2022. 05.31 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව.
IV. 2022.04.25 වන දින පැවති කාර්මික කමිටු වාර්තාව.
V. 2022.05.23 වන දින පැවති කාර්මික කමිටු වාර්තාව.

**<u>(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ඉදිරිපත් කිරිම.</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

2022 මැයි මස ආදායම් වියදම් අයකර ගැනිම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව

( එල්.ජී.13) ගරු මහා සභාවේ දැන ගැනිම සඳහා මෙන්ම අනුමැතිය සඳහා ද ඉදිරිපත් කරනවා.

**<u>යෝජනා අංක 119- 06-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, සියළුම දෙනාගෙන් අවසරයි. සභාවට ඉදිරිපත් කරන ලද 2022 මැයි මස ආදායම් වියදම් අයකර ගැනිම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව ( එල්.ජී.13) සත්‍ය වාර්තා බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි මේවන තුරු සේවකයන්ට නිළ ඇඳුම් දීමනාව ලබා දීලා නෑ.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

අය වැය අනුව සභාවට ආදායම් එකතු වෙලා නෑ. රටේ පවතින තත්ත්වය නිසා වියදම් වැඩි වෙලා තියෙන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජී.නිමල් රාජපක්ෂ මැතිතුමා.</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකගතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>(ඍ) නොපැමිණෙන මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අවසර ලිපි ඉදිරිපත් කිරිම.</u>**

පී මධුර කුමාර පියරත්න ,එච්.එම්.නාසීම් , ආර්.පී.එන්.එල්.අබේරත්න යන සභික වරුන් විසින් නොපැමිණෙන බවට දැනුම් දීලා තියෙනවා.

**<u>(එ) ගරු සභිකවරුන්ගේ වෙනත් අදහස් ඉදිරිපත් කිරිම.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.</u>**

පසුගිය කාල සීමාව තුළ පොත් බෙදා දීම සම්බන්ධයෙන් විශාල මුදලක් වෙන් කලා.මෙම කාලයේ අධික ලෙස පොත් මිළ ඉහළ යාම නිසා බෙදා නොදුන් පොත් කඩිනමින් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.ඉන්ධන නැතිනම් මම පෞද්ගලිකව බෙදලා දෙනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

කීපදෙනෙක්ගේ තියෙනවා.ඒ ටික දෙමු.සමහර මන්ත්‍රීවරු ලැයිස්තු ඉදිරිපත් කරලා නෑ.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

පොත් ලබා නොදුන් අයගේ ලැයිස්තුව සොයා ගෙන ලබා දීමට කටයුතු කරන්න.

ඒ වගේම ගරු සභාපතිතුමනි,මේ දවස්වල ඉන්ධන ගැටලුව නිසා මන්ත්‍රීවරු විදියට ලොකු අපහසුතාවයන්ට ලක් වෙනවා.ගරු සභාපති තුමනි ඔබතුමා හරහා අනුරාධපුර පෙට්‍රෝලියම් ආයතනයේ සභාපති තුමාට නම් ලැයිස්තුව සමඟ දැනුවත් කිරීමට කටයුතු කරන්න. ඒ අනුව ඒ නම් ලැයිස්තුව ෂෙඩ් එකට ලබා දීලා අදාල සහනය ලබා දෙන්න. ඒ වගේම මේ දිනවල පෙහොර ලබා දීම සම්බන්ධයෙන් රජයෙන් යම් වැඩපිළිවෙලක් යෝජනා වෙලා තියෙනවා.ඒකටත් උත්තරයක් ලැහැස්ති කරලා තියා ගන්න ඕන .

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.</u>**

රජයෙන් ලබා දීමට නියමිත යූරියා පොහොර එක හොද නෑ.ඒකට ගොයම් පැලේ කුණු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා.**

ගරු සභාපති තුමනි,පසුගිය දිනයක අවට කාර්යාල සමඟ එක් වී පැවැත්වූ ශ්‍රමදානයේදී මහජන නියෝජිතයෝ ලෙස අපි ලොකු අපහසු තාවයකට ලක් වූනා. ඒ නිසා මින් ඉදිරියට මෙවැනි ශ්‍රමදාන පැවැත්වීමේදී නිසි කළමණාකරනයක් අනුව පැවැත්විය යුතුය.ඒ තුළින් සභාවේ ගෞරවය ආරක්ෂා වෙනවා.

ඒ වගේම පරිසර කමිටුවේ ක්ෂේත්‍ර නිරීක්ෂණ සඳහා යාමට ඉන්ධන ගැටළුවක් මතුවෙලා තියෙනවා ඒ සඳහා අපට වාහනයක් හෝ ඉන්ධන ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. ඒ වගේම අපගේ නිළ හැඳුනුම්පත් මේ වන තුරු සකස් කර නොමැති බැවින් ඒ පිළිබඳවද අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**

පරිසර කමිටුව කියන්නේ කමිටුවට ඉදිරිපත් වන ලිපි සම්මත කර ගැනීම පමණක් නොවේ.තිරප්පනේ ප්‍රාදේශීය සභා බළ ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය ගැටළු දික්කසාද ගැටළු ආදීය බොහෝමයක් තියෙනවා. ඒ වගේම පෙරියකුලම සෙලෙස්තිමඩුව යන ප්‍රදේශවල කැලේ කුණු දානවා.දැනට අපේ ධූර කාලය දැනට අවුරුදු හතරහමාරයි.එම කාලය තුළ අදායම් කොපමණ රැස් කර තියෙනවාද ඒ වගේම කොපමණ මහජන සේවයක් කරලා තියෙනවාද යන්න සොයා බැලීම අවශ්‍යයි.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

පොඩි කාලයක් දෙන්න හදලා දෙන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා සභික - කේ.නදීකා සෙව්වන්දි කරුණාරත්න මැතිණිය**

සියළු දෙනාගෙන්ම අවසරයි.ළමා හා කාන්තා කමිටුවේ නිසංසලා මන්ත්‍රීතුමිය කමිටු වාර සඳහා සහභාගී වුනේ නෑ එබැවින් ස්ථිර මන්ත්‍රීවරයෙක් ඒ සඳහා සම්බන්ධ කරලා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපති තුමනි,තිරප්පනේ ප්‍රාථමික විද්‍යාලයට මෙහා පැත්තේ මත්ද්‍රව්‍ය විකුණනවා කියලා ගමේ මිනිස්සු කියනවා.පොලීසිය නෑ කියනවා.එබැවින් මේ පිළිබඳව අවධානය යොමු කරන්න. ඒ වගේම ළමයි ඉරිදා දහම්පාසල් එන්නේ නෑ.පෙර පාසල් ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේ හරහා දහම්පාසල් ආරම්භ කිරීමට ප්‍රථම මව් ගුණ ගීත ශ්‍රවණය කිරීමට සලස්වන ලෙස දැනුවත් කිරිමට කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිමි.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

උපකාරක පංති දහම්පාසල් වෙලාව තුළ තයෙනවාද කියලා හොයන්න.ඒවා නවත්වන්න අපි මැදිහත් වෙමු.

**ගරු ප්‍රාදේශීය සභා සභික -සුසන්ත රාජකරුණා මැතිතුමා.**

මේ වන විට පිළිසරු ඒකකය වජිර මහත්තයා විසින් හොඳින් පවත්වාගෙන යනවා.ඒක තිබ්බ තත්ත්වයට වඩා දැන් හොඳයි.අවට පරිසරය පවිත්‍ර කරලා එළවළු හදලා ආදායම් රැස් කර ගමු. මම රාජිට කිව්වා විදුලි බෝඩ් එක හදන්න කියලා.ඒක වගකීමෙන් කරලා නෑ.ඒ නිසා එය නිසි වගකීමක් ඇතිව හදන්න කියලා මම ඉල්ලා සිටිනවා ආර් .ඕ .ප්ලාන්ට් එකට සම්බන්ධ කරන වයර් එක බිම දාලා තියෙනවා මම දැක්කා.ඒක හදලා දෙන්න.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ඒ අනුව අද දින සභාවේ වැඩ කටයුතු වලට සහභාගී වී සහයෝගය ලබා දුන් සියළුම දෙනාටම ස්තූතිවන්ත වන අතර,අද දින සභාවේ වැඩ කටයුතු හමාර කරනවා.ස්තූතියි.

2022.06.16 වන දින පැවති ගරු මහ සභාවේ වැඩ කටයුතු ප.ව. 12.10 ට පමණ අවසන් විය.